Embassy of the United States of America
Colombo

# PRESS RELEASE

Public Affairs Section
Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070
Email: shenjy@state.gov ● http://srilanka.usembassy.gov

Release No. 20160522

**එක්සත් ජනපදය විසින් ගංවතුරෙන් පීඩාවට පත් ජනතාව සඳහා තවදුරටත් ආධාර**

මැයි 22, 2016: ශ්‍රී ලංකාවේ ගංවතුර සහන සේවා සඳහා සහාය දැක්වීමට එක්සත් ජනපද රජය තවත් රුපියල් මිලියන 36 (ඇමෙරිකානු ඩොලර් 250,000) ප්‍රධානය කිරීමට තීරණය කර ඇත.

මෙම ආධාර මුදල ලබාදී ඇත්තේ, දැනට එක්සත් ජනපද රජය විසින් ගංවතුරෙන් වඩාත් පීඩා විඳින ජනතාවගේ මානුෂීය ආධාර කටයුතු සඳහා සහාය වීමට ප්‍රධානය කර ඇති රුපියල් මිලියන 7.2 ක (ඇමෙරිකානු ඩොලර් 50,000) මූල්‍යාධාරය සහ ගංවතුර සහ නියං තත්ත්ව වලින් වඩාත් පීඩාවට පත්වන ජනගහන සඳහා ආරක්ෂිත, ආපදා සඳහා ඔරොත්තු දිය හැකි ලෙස සැලසුම් කරමින් පවතින, රුපියල් මිලියන 144 ක් (ඇමෙරිකානු ඩොලර් මිලියනයක්) වටිනා තුන්-අවුරුදු පානීය ජල ව්‍යාපෘතියට අමතරවයි.

මේ අනුව එක්සත් ජනපද රජය විසින් හදිසි සහ කෙටි-කාලීන ගංවතුර ආධාර වශයෙන් දැනට ලබා දී ඇති මූල්‍යාධාර වල මුළු වටිනාකම රුපියල් මිලියන 187 ක් (ඇමෙරිකානු ඩොලර් මිලියන 1.3) පමණ වෙයි.

මීට අමතරව එක්සත් ජනපද රජය විසින් දීර්ඝ කාලීන සහාය ලබාදීමේ සහ හැකියා වර්ධන වැඩසටහන් ලෙස, ශ්‍රී ලංකා රජය සමඟ කටයුතු කරමින් මෙරට ආපදා කළමනාකරණ පද්ධති සංවර්ධනය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය හරහා මෙරට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය තුළ මානුෂීය තොරතුරු කළමණාකරණය හා සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීමද තවදුරටත් ක්‍රියාත්මක වෙයි.

තානාපති කාර්යාලය විසින් දැනට පවතින හදිසි ආපදා තත්ත්වය අධීක්ෂණය කරමින් සිටින අතර ඉදිරියේදී වැඩිදුරටත් ඇතිවිය හැකි අවශ්‍යතා කඩිනමින් හඳුනා ගැනීමට ශ්‍රී ලංකා රජය සමඟ සමීපව කටයුතු කරමින් සිටියි.

###